සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය **ශිල්ප කලා - I** **කාලය පැය 3 යි**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

01. ශ්‍රී ලාංකික ගැමි නැටුම් කලාව අයත් වන ජන කලා ප්‍රභේදය කුමක් ද?
(1) ශ්‍රව්‍ය කලාය. (2) දෘශ්‍ය කලාය. (3) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාය. (4) කෝලම් කලාය.

02. මෙම රූප සටහනේ දැකිය හැකි ජ්‍යාමිතික නිර්මාණ කිරීමට භාවිතා කළ හැකි උපකරණය වන්නේ,



(1) කෝණමානය.
(2) අඩිකෝදුවය.
(3) විහිදි චතුරස්‍රය.
(4) කවකටුවය.

03. රූපයේ දැකිය හැකි රේඛා වර්ග නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.



(1) සිරස් රේඛා, තිරස් රේඛා, වක්‍ර රේඛා, ආනත රේඛා ය.
(2) සිරස් රේඛා, තිරස් රේඛා, වක්‍ර රේඛා, සරල රේඛා ය.
(3) ආනත රේඛා, වක්‍ර රේඛා, සිරස් රේඛා, කඩ රේඛා ය.
(4) වක්‍ර රේඛා, ආනත රේඛා, සමාන්තර රේඛා, ඝන රේඛා ය.

04. පහත දැක්වෙන රේඛාව භාවිතා වන අවස්ථාව වන්නේ,



(1) ඡේදනයවන ස්ථානය දැක්වීමට ය.
(2) මධ්‍ය අක්ෂරය පෙන්වීමටය.
(3) සමමිතික බව දැක්වීම සඳහාය.
(4) සැඟි දාර දැක්වීම සඳහාය.

05. පහත දැක්වෙන නිර්මාණ සඳහා වෘත්තයේ කුමන කොටස් උපයෝගී කරගෙන තිබේ ද?



(1) අර්ධ වෘත්තය, කේන්ද්‍රික ඛණ්ඩය.
(2) අර්ධ වෘත්තය, වෘත්ත ඛණ්ඩය.
(3) අර්ධ වෘත්තය, වෘත්ත පාදය.
(4) අර්ධ වෘත්තය, පරිධිය.

06. පහත දැක්වෙන කෝණ නිවැරදිව නම් කර ඇති පිළිතුරු තෝරන්න.



(1) සුළු, සරල, පරාවර්ත කෝණ ය. (2) සෘජු, මහා, සරල කෝණ ය.
(3) මහා, සෘජු, සුළු කෝණ ය. (4) සුළු, සෘජු, මහා කෝණ ය.

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

07. පහත දැක්වෙන්නේ ත්‍රිකෝණ වර්ග කීපයක ලක්‍ෂණයි.

A - සෑම පාදයක් ම එකිනෙකට දිගින් අසමාන වේ.

B - පාද දෙකක් පමණක් සමාන වේ.

C - පාද තුනම දිගින් සමාන වේ.

මේ ලක්‍ෂණ අනුව පිළිවෙලින් ත්‍රිකෝණ වර්ග කර ඇති පිළිතුර තෝරන්න.

(1) සුළු, මහා, සෘජු කෝණී ත්‍රිකෝණ ය. (2) විෂමපාද, සමද්විපාද, සමපාද ත්‍රිකෝණ ය.

(3) සමද්විපාද, සමපාද, විෂමපාද ත්‍රිකෝණ ය. (4) සමද්විපාද, විෂමපාද, සමපාද ත්‍රිකෝණ ය.

08. පහත දක්වා ඇති රූප සටහනේ සමචතුරස්‍රාකාර හැඩැති පැති කීයක් දැකිය හැකි ද?



(1) 04 කි.

(2) 02 කි.

(3) 01 කි.

(4) 06 කි.

09. පහත දැක්වෙන්නේ සම්පූර්ණ විකසන නිර්මාණයකි. එය කුමන වස්තුවක විකසන නිර්මාණයක් ද?



(1) කේතුවක ය.

(2) චතුරස්‍රයක ය.

(3) ප්‍රිස්මයක ය.

(4) සිලින්ඩරයක ය.

10. ඇඳ ඇති ඉලිප්සකයක නාභීන් සෙවීම සඳහා කළ යුතු පියවර මෙසේ ය.

A - මහා අක්‍ෂයෙන් අඩක් දුරක් කවකටුවට ගැනීම.

B - මහා අක්‍ෂය දෙපසට ඡේදනය කිරීම.

C - සුළු අක්‍ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍රය කර ගැනීම.

D - මහා අක්‍ෂය හා සුළු අක්‍ෂය ඡේදනය කිරීම.

මෙහි නිවැරදි පිළිවෙල වන්නේ,

(1) A, B, C ය. (2) A, C, B ය. (3) A, D, C ය. (4) A, C, D ය.

11. හණ කෙඳි වලින් වියනු ලබන රෙදි හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) විස්කෝස් (2) පොප්ලින් (3) ලිනන් (4) නයිලෝන්

12. ලෝකයේ ඇති කපු වර්ල අතරින් ඉතා උසස්ම කපු වර්ගය වන්නේ,

(1) පිලර් කපු (2) සී අයිලන්ඩ් කපු (3) ඇමරිකන් උස්බිම් කපු (4) චීන කපු

13. ශාක කෙඳි වල කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, මූලද්‍රව්‍ය අඩංගු නිසා ශාක කෙඳි හඳුන්වන නම කුමක් ද?

(1) සෙලියුලෝස් කෙඳි (2) කෘත්‍රිම කෙඳි (3) ප්‍රෝටීන් කෙඳි (4) ඛනිජමය කෙඳි

14. රෙදි නිෂ්පාදනයට ගන්නා කෙඳි හඳුනාගැනීමට කෙඳි පිළිස්සීමේ දී පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන්නේ කුමන කෙඳි වල ද?

(1) ලෝම, සේද (2) කපු, ලිනන් (3) ලිනන්, ලෝම (4) කපු, කෘතිම සේද

15. ලෝම රෙදි නිෂ්පාදනයට උසස්ම ලෝම ලබාගන්නා සතා වන්නේ,

(1) දෙමහුන් බැටළුවා (2) දික්ලොම් බැටළුවා (3) මස් බැටළුවා (4) මැරීනෝ බැටළුවා

16. ඛණිජ කෙඳි වලින් නිෂ්පාදනය කරන ලද ඇඳුම්වල දැකිය හැකි ගුණාංගයකි,

(1) තාපයට ඔරොත්තුදීම හා ගිනි නොගැනීම. (2) සීතලට ඔරොත්තු දීම.

(3) ජලාකර්ෂණතාව. (4) දිලිසෙන සුළු බව.

17. රෙදි පිරියම් කිරීමේ දී රෙද්දේ ඇති අපද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය මගින් පිළිස්සීමට ලක්කර කාබන් බවට පත් කිරීම හඳුන්වන්නේ,

(1) මළහරණය. (2) විරංජනය. (3) කැඳහරණය. (4) කාබනීකරණය.

18. සේද රාමු මුද්‍රණයේ දී රාමුවට සවිකිරීම සඳහා වෙළඳපලෙහි ඇති විශේෂිත රෙදි වර්ගය මින් කුමක් ද?

(1) පොප්ලින් (2) බෝල්ටින් ක්ලෝත් (3) විස්කෝස් (4) රුන්ගල්

19. නූල් අංක කිරීමේ දී කෙඳි වර්ගය අනුව නූල් කැරැල්ලක දිග වෙනස් වේ. ලිනන් නූල් කැරැල්ලක සම්මත දිග වන්නේ,

(1) යාර 560 (2) යාර 840 (3) යාර 300 (4) යාර 1000

20. මෙට්‍රික් ක්‍රමයට නූල් අංක කිරීමේ දී කිලෝග්‍රෑම් එකක මීටර් 1000 නූල් කැරලි 5 ක් අඩංගු වේ නම් එහි නූල් අංකය කීය ද?

(1) 5^{5} (2) 10^{5} (3) 1^{5} (4) 20^{5}

21. අංක 40^{5} තනිපට නූලක් දෙපට අඹරාගත් විට එහි අංකය $2/40^{5}$ වේ. ඒ අනුව කිලෝග්‍රෑම්1 කට අල්ලන නූල් මල් ගණන කීයද?

(1) 40 (2) 20 (3) 80 (4) 10

22. සෙන්ටිමීටරයකට දික්නූල් 40 ක් ඇති ඇඳ රෙදි හැදයක පළල 90 cm කි. හැදයේ දිග 100 m කි. හැදයට අවශ්‍ය දික්නූල් සංඛ්‍යාව කීය ද?

(1) 3600 (2) 4000 (3) 9000 (4) 100

23. පහත රූප සටහන් අතරින් තුඩුහීරි වියමනේ නූල් ඇදීම දැක්වෙන රූප සටහන කුමක් ද?



(1) (2) (3) (4)

24. පහත රූප සටහන් වලින් සරල හීරි වියමන දැක්වෙන රූප සටහන කුමක්ද?



(1) (2) (3) (4)

25. වැසි සුළං සහ ගංගා ඇළදොළ ජල ප්‍රවාහ සහ භූ චලන මගින් ජීරණය වූ ස්ථානයක සිට වෙනත් ස්ථානයක තැන්පත් වන මැටි හඳුවන්නේ,

(1) ප්‍රාථමික මැටි (2) ද්විතීයක මැටි (3) රතු මැටි (4) කළු මැටි

26. සැලකිය යුතු ප්‍රමාණයක් යකඩ අඩංගු වී ඇති ලා කහ පැහැයක් ගන්නා මැටි වර්ගය වන්නේ,

(1) තලප මැටි (2) බෝල මැටි (3) ගිනි මැටි (4) කළු මැටි

27. වර්තමානයේ පවා ග්‍රාමීය මැටි කාර්මික ශිල්පීන් වැඩි භාණ්ඩ ප්‍රමාණයක් නිපදවීම සඳහා යොදා ගන්නා සකපෝරුව හඳුන්වන්නේ කිනම් නමකින් ද?

(1) අත් සකපෝරුව (2) පා සකපෝරුව (3) විදුලි සකපෝරුව (4) අතින් තෙරපීම

28. එකම හැඩය ඇති භාණ්ඩ විශාල ප්‍රමාණයක් කිසිදු වෙනසක් නැතිව නිෂ්පාදනය කරගත හැක්කේ කුමන ක්‍රමයට ද?

(1) අච්චු භාවිතය (2) දරුණු භාවිතය (3) තහඩු භාවිතය (4) සකපෝරු භාවිතය

29. මැටිවල ජලය උරා ගැනීමේ හැකියාව ලැබෙන්නේ සිදුරු සහිත බව හඳුන්වන්නේ,

(1) සුවිකාර්යතාවය (2) සවිවරතාවය (3) හැකිළීම (4) ඝනත්වය

30. මහා පරිමාණ කර්මාන්ත ශාලාවල භාණ්ඩ සෑදීම නොඇල්ලෙන සුළු අමුද්‍රව්‍ය කුඩු කර ගැනීම සඳහා භාවිතා කරන යන්ත්‍රය කුමක් ද?

(1) බෝල්මිල් යන්ත්‍රය (2) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය

(3) ජෝක්‍රෂර් යන්ත්‍රය (4) ෆිල්ටර් ප්‍රේෂ් යන්ත්‍රය

31. ප්ලාස්ටර් ඔප් පැරිස් සකස් කර ගනු ලබන්නේ කිනම් හුණු ගල් විශේෂයකින් ද?

(1) පෙල්ඩ්ස්පාර් වලිනි (2) ජිප්සම් වලිනි (3) සිලිකාවැලි වලිනි (4) ඩොලමයිඩ් වලිනි

32. මහා පරිමාණ කම්හල්වල ප්‍රධාන උසස් තත්වයේ මැටි භාණ්ඩ පිළිස්සීම සිදු කරයි. මේ සඳහා භාවිතා කරන පෝරණු කාණ්ඩය තෝරන්න.

(1) යටිදහර පෝරණුව, රෝලර් පෝරණුව (2) උඩුදහර පෝරණුව, දෝනා පෝරණුව

(3) ආවරක පෝරණුව, යටි දහර පෝරණුව (4) දෝනා පෝරණුව, රෝලර් පෝරණුව

33. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් පසු වර්ණවත් කර ගැනීමේ දී වඩාත් තීව්‍ර වර්ණයක් ලබා ගැනීම සඳහා ගැල්විය යුතු වන්නේ,

(1) ලැකර් තීන්ත ආලේපය (2) වාර්නිෂ් ආලේපය

(3) ඉමල්ෂන් තීන්ත ආලේපය (4) බයින්ඩර්ගම් ආලේපය

34. උද්‍යාණ අංලකරණය නිර්මාණයේ දී අනුගමනය කළ යුතු ක්‍රම දෙක මොනවා ද?

(1) පූර්ණ හා අධි උන්නතය (2) බීරළු හා කැටයම් කැපීමය

(3) මූර්ති හා කැටයම්ය (4) අර්ධ හා අල්ප උන්නතය

35. උද්‍යාන මූර්තියක් හෝ කැටයමක් නිර්මාණය කිරීමට පෙර සුදුසු ස්ථානයක් තෝරා ගැනිම හඳුන්වන නම කුමක් ද?

(1) විවිධත්වය (2) කැපීපෙනෙන සුලු බව

(3) තෝරාගත් ස්ථානය (4) අවකාශය

36. රූප සටහනේ දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



(1) දම්වැල් මැස්ම

(2) කතිර මැස්ම

(3) ලෙස්ඩේසි මැස්ම

(4) සැටින් මැස්ම

37. පේපර් ක්විලින් නිර්මාණයක් කිරීමේ මූලික පියවර කිහිපයක් පහත දැක්වේ. ඒවා පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - කඩදාසි පටි රෝල් කිරීම.

B - සමතලා මතුපිට අලවා ගැනීම.

C - අවශ්‍ය ප්‍රමාණවලට ලිහිල් කිරීම.

D - රෝල්කරගත පටි හැඩ ගැන්වීම.

F - සැකසූ නිර්මාණයට නිමාවක් ලබා දීම.

(1) BCDAEF (2) ABCDEF (3) EADCBF (4) EBCDAF

38. ස්වභාවික මල් සැරසිලි සැකසීමේ දී මල් රැඳවීමට වඩාත් සුදුසු වන්නේ,

(1) ඩ්‍රයිෆෝම්ය (2) සෘජුෆෝම්ය (3) පොලිෆීල්ය (4) වෙට්ෆෝම්ය

39. ආභරණ සකස් කිරීමේ දී පාන ක්ලේ මිශ්‍රණයට කපුරු කඩු එක්කිරීමෙන් බලාපොරොත්තු වන්නේ,

(1) සුවඳ පවත්වා ගැනීම. (2) කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම.

(3) වර්ණවත් කර ගැනීම. (4) හොඳින් මිශ්‍රකර ගැනීම.

40. කඩදාසි මාධ්‍යයෙන් සකස්කරන මල් කල්පවත්වා ගැනීම සඳහා ඉටි ගැල්වීම සිදුකරයි. මේ සඳහා සුදුසු ඉටි වර්ගය වන්නේ,

(1) මී ඉටි (2) තල් ඉටි (3) පැරපින් ඉටි (4) සෙලෝපේන් ඉටි

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

ශිල්ප කලා - II

කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) ''අපේ සවියෙන් රට ගොඩනගමු'' තේමා කරගත් ප්‍රදර්ශනයක් කලාප මට්ටමින් සූදානම් කර ඇත. මේ සඳහා පාසලේ සියලු සිසුන්ගේ දෑතේ නිර්මාණ හා නව නිපයුම් අතරින් තෝරාගත් නිර්මාණ සියල්ල කලාප කාර්යාලයට යැවීමට සූදානම්කර තිබේ.

(i) නිර්මාණ සඳහා යොදාගත හැකි මාධ්‍ය 04 ක් ලියන්න.

(ii) තේමාව රැගත් පෝස්ටරය රටා යෙදූ පන්පැදුරක ප්‍රදර්ශනය කිරීමට සූදානම් කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි හීරිවියමනක් ඇඳ දක්වන්න.

(iii) ප්‍රදර්ශනය විවෘත කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ආරාධනා කිරීමට සුදුසු නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(iv) ප්‍රදර්ශනයේ ඉදිරිපස ගේට්ටුව අසල තැබීමට සුදුසු මැටි මාධ්‍යයෙන් කළ නිර්මාණ 02 ක දළ රූප සටහනක් අඳින්න.

(v) ස්වභාවික ශාක කෙඳි යොදාගෙන කළ ගෙතුම් පටියක් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි ආරාධිත අමුත්තන්ට සමරු තිළිණයක් ලෙස ලබා දීමට සූදානම්කර ඇති අතර ඒ සඳහා යොදාගත් ස්වභාවික ශාක කෙඳි වර්ග 04 ක් ලියන්න.

(vi) ප්‍රදර්ශන කුටි තුළ විවිධ හැඩැති මල් සැකසුම් තබා තිබුණි. ඉන් මනාලියන්ගේ මල්කළඹකට සුදුසු හැඩ 04 ක් ඇඳ නම් කරන්න.

(vii) මැටි භාණ්ඩ විවිධ අයුරින් අලංකාර කර තිබුණි. ඒ අතරින් හම්පදම් අවස්ථාවේ අලංකාර කරන ක්‍රම 02 ක් ලියන්න.

(viii) පාසල් මට්ටමේ ජයග්‍රහණ කලාපයට යැවීම සඳහා ආරක්ෂිත පෙට්ටි සකසා තිබුණි. එවැනි පෙට්ටි නිර්මාණය සඳහා යොදාගත් ආකෘතියක විකසනය අඳින්න.

(ix) ජයග්‍රහකයින් සඳහා සමරු තිළිණ හා කුසලාන ලබාදීමට ද තීරණය විය. එකම ප්‍රමාණයේ එකම හැඩයේ කුසලාන සකස්කිරීමට යොදාගත හැකි ශිල්පීය ක්‍රමයක් නම් කරන්න.

(x) පාසල් ප්‍රදර්ශනයේ ඉදිරිපස තොරණ අංලකාර කිරීම ස්ටෙන්සිල් මෝස්තරයක් අඳින්න.

(ලකුණු 10 × 2 = 20)

(02) කාඩ්බෝඩ් හෝ වැනි ද්‍රව්‍යයන් භාවිත කර ශිල්ප කලා විෂයට අදාළ විවිධ භාණ්ඩ නිර්මාණය කරයි.

(i) විකසන කිරීම යනු කුමක් ද? (ලකුණු 02)

(ii) විකසනය නිර්මාණය කිරීම සඳහා භාවිතා කරන ඝන වස්තුවල මූලික හැඩතල දෙකක් අඳින්න. (ලකුණු 04)

(iii) ඉහත ඔබ නම් කළ ඝන වස්තුවක විකසනය නිර්මාණය කරන්න. කැමති පරිමාණයක් භාවිතා කරන්න. (ලකුණු 04)

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(03) මිනිසා එදිනෙදා පරිහරණය සඳහා ගන්නා රෙදිපිළි ඉතා අලංකාරව නිෂ්පාදනය කරයි.

(i) ගවුම් රෙද්දක් සඳහා සුදුසු සිදුරු තහඩුවක් අඳින්න. (ලකුණු 02)

(ii) කපු රෙදි සඳහා යොදා ඇති කැඳ ඔබට පහසුවෙන් ඉවත් කළ හැකි ක්‍රමයක් ලියන්න. (ලකුණු 04)

(iii) ගැටපඩු ක්‍රමයට සාරියක් අලංකාර කර ගන්නා අයුරු ලියන්න. (ලකුණු 04)

(04) අතීතයේ සිටම මිනිසා අත් යන්ත්‍ර මගින් රෙදි වියාගනු ලබයි.

(i) අත්යන්ත්‍රයක් මගින් විවීම සඳහා හැදයක් පිළියෙල කිරීමේ දී පනාවෙන් ලබා ගන්නා ප්‍රයෝජන 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) අත් පිස්නා විවීම සඳහා ජටා වියමන යොදා ගන්නා ලදී. ජටා වියමනේ එකක දෙකක් ඇඳ හීල්ස් වැටි (පුඩුවැල් පේලි) වලින් නූල් ඇදීම ලකුණු කරන්න. (ලකුණු 04)

(iii) දිග මීටර් 100 ක්ද, සෙන්ටිමීටර් 1ට දික්නූල් 30ක් ඇති අත්පිස්නා හැදයක පළල සෙන්ටිමීටර් 30 කි. දික්නූල් අංකය 2/305 වේ. එම හැදයට අවශ්‍ය දික්නූල් වල බර සොයන්න. (ලකුණු 04)

(05) මැටි භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා මැටි පදම් කළ යුතුය.

(i) මැටි පදම් කිරීමේ ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා ඇලෙන සුළු සහ නොඇලෙන සුළු අමුද්‍රව්‍ය ලියන්න. (ලකුණු 04)

(iii) සකපෝරු වර්ග තුන ලියා සකපෝරුව ආධාරයෙන් මැටි භාණ්ඩයක් ඉදිකර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 04)

(06) වර්තමානයේ උද්‍යාන අලංකරණ කිරීමේ කලාව ජනප්‍රියත්වයට පත්ව ඇත.

(i) මූර්ති ගොඩනැගීමේ දී භාවිතා කරන ශිල්පීය ක්‍රම මොනවාද? (ලකුණු 02)

(ii) වර්තමානයේ උද්‍යාන මූර්ති කල්පැවැත්ම ඉහළ ආදායම් වර්ග ලබා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍යයක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉහතින් ඔබ නම් කරන ලද මාධ්‍ය වලින් කැමති මාධ්‍යයක් උද්‍යාන මූර්තියක් සකස් කර ගන්නා ආකාරය ලියන්න. (ලකුණු 04)

(07) විවිධ විසිතුරු නිර්මාණ කිරීම ගෘහ අලංකරණය සඳහා උපකාරී වේ.

(i) ගෘහ අලංකරණ සඳහා භාවිතා කරන රිබන් ආශ්‍රිත නිර්මාණ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා භාවිතා කරන මැහුම් ක්‍රම 04 ක් ලියන්න. (ලකුණු 04)

(iii) කුෂන් කවරයක් සඳහා සුදුසු ඔබ කැමති මෝස්තරයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව **තෙවන වාර පරීක්ෂණය 2020**

11 ශ්‍රේණිය **ශිල්ප කලා**

පිළිතුරු පත්‍රය - I කොටස

01. (3)	02. (4)	03. (1)	04. (4)	05. (1)	06. (4)	07. (2)	08. (3)	09. (4)	10. (2)
11. (3)	12. (2)	13. (1)	14. (1)	15. (4)	16. (1)	17. (4)	18. (2)	19. (3)	20. (1)
21. (2)	22. (2)	23. (2)	24. (1)	25. (2)	26. (2)	27. (1)	28. (1)	29. (2)	30. (3)
31. (2)	32. (4)	33. (2)	34. (3)	35. (4)	36. (4)	37. (3)	38. (4)	39. (2)	40. (3)

II පත්‍රය

(01) (i) මැටි, සිමෙන්ති, ප්ලාස්ටර් පැරිස්, කඩදාසි ආදිය.
(ii) සරල හීර, දඟරහීරි, රුවිතහීරි, රළහීරි, සංයෝජිත හීරි වැනි එකක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(iii) දිනය, වේලාව, ස්ථානය, කාරණය වැනි කරුණු ඇතුලත්ව සකස්කරන ලද ආරාධනා පත්‍රයක් සඳහා ලකුණු ලබා දෙන්න.
(iv) රූප සටහන් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(v) කෙසෙල්, හණ, නියද, රැමී, සෙනා, සිසල් වැනි
(vi) දිගැටි හැඩය, පෙරසි හැඩය, අශ්ව ලාඩගමක හැඩය අයිඩ්‍රොප් හැඩය වැනි.
(vii) කැටයම් ඇලීම, ඔංගොබි දැමීම, සීරුම් මෝස්තර යෙදීම මුද්‍රා යෙදීම වැනි.
(viii) ඝනකය ඝනකාභය වැනි ඒකක විකසනය නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ix) අච්චු, ස්ටෙන්සිල් වැනි ක්‍රම ශිල්පයන් යොදා ගැනීම.
(x) ස්ටෙන්සිල් සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 × 10 = 20)

(02) (i) යම් ඝන වස්තුවක් දිග හැර ඇඳීම වේ.
(ii) සිලින්ඩරය, ප්‍රිස්මය, චතුරස්‍රය කේතුව ආදී ඝන වස්තුවල රූප සටහන් ඇඳ තිබේ නම් ලකුණු ලබා දෙන්න.
(iii) ඉහත නම් කර රූප සටහනක විකසනය නිර්මාණය කර තිබේ නම් ලකුණු ලබා දෙන්න.

(03) (i) සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න.
(ii) සේදීම
(iii) ගැටපඬු ක්‍රමයට අදාළව සාරියක් අලංකාර කර ගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(04) (i) නූල් පීරා ගැනීම, නූල් කැඩීම වළක්වා ගැනීම කැඩුණු නූල් සේවීම පහසු වීම.
(ii) ජටා වියමනේ ඒකක දෙකක් ඇඳ තිබේ නම් ලකුණු ලබා දෙන්න.
(iii) දික් නූල් ප්‍රමාණය $= \frac{100 \times 30 \times 30}{1000 \times 15}$
$= \underline{\underline{6\ kg}}$

(05) (i) ග්‍රාමීය හා මහපරිමාණ වශයෙන්
(ii) ඇලෙන සුළු අමුද්‍රව්‍ය - කෙඔලින්, බෝල, රතු, ආදිය
නොඇලෙන සුළු - ෆෙල්ස්පාර්, ක්වාට්ස්, සොලමයිට් ආදිය.
(iii) අත් සකපෝරුව / පා සකපෝරුව / විදුලි සකපෝරුව
සකපෝරුවක් ආධාරයෙන් භාණ්ඩයක් ඉදි කිරීම පියවර වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(06) (i) පූර්ණ උන්නත, අර්ධ උන්නත, අල්ප උන්නත
(ii) ලෝහ, කළුගල්, කිරිගරුඬ, සිමෙන්ති ආදිය
(iii) පියවර වශයෙන් ලියා තිබේනම් ලකුණු දෙන්න.

(07) (i) බිත්ති සැරසිලි, කුෂන් කවර ආදිය
(ii) රිබන් මැස්ම, කෙළින් මැස්ම, ලේසිඩේසි මැස්ම, නැටි මැස්ම, ලූප් මැස්ම, ප්‍රංශ ගැට මැස්ම.
(iii) සුදුසු මෝස්තරයකට ලකුණු ලබා දෙන්න.